# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

## වාර්ෂික වාර්තාව හා ගිණුම්

## 2005

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 1 වන කොටස | හැඳින්වීම | 01 - 03 |
| 2 වන කොටස | | |
| | 2 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිළධාරීන් පිළිබඳ ලුහුඩු විස්තරයක් | 04 |
| | 2.1 ව්‍යසන කළමනාකරණ සඳහා වූ ජාතික සභාවේ සංයුතිය | 05 |
| 3 වන කොටස | | |
| | 3 කාර්යවලය පිළිබඳ අධ්‍යක්‍ෂ ජනරාල් විසින් කරනු ලබන සමාලෝචනය | 06 - 09 |
| 5 වන කොටස | මුල්‍ය ප්‍රකාශන | 10 - 18 |
| 6 වන කොටස | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2005 ජුලි 12 සිට 2005 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ජේදය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව | 19 - 26 |

# 1. හැඳින්වීම

වර්ෂ 2005 ජුලි මාසයේදී 2005 අංක 13 දරණ ශ්‍රීලංකා ව්‍යසන කළමනාකරණ පනත ක්‍රියාත්මක වීමත් සමග ආපදා කළමනාකරණය පිළිබඳ නිත්‍යානුකූල පදනමක් ස්ථාපිත විය. ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික සභාව අන්තර් අමාත්‍යාංශ මට්ටමේ සංවිධානයකි.. එහි සභාපතිවරයා හා උපසභාපතිවරයා අනුපිළිවලින් අතිගරු ජනාධිපතිවරයා හා අග්‍රාමාත්‍යාවරයාවේ. ජාතික සභාවේ සෙසු සාමාජිකයින් වනුයේ විපක්ෂනායක, විෂය භාර ඇමැතිවරු 20, පලාත් සභා ප්‍රධාන අමාත්‍යවරුන් සහ විරුද්ධ පක්ෂ මන්ත්‍රීවරුන් 5 දෙනෙකුවේ.

ස්වභාවික හා වෙනත් වර්ගයේ ආපදා සම්බන්ධයෙන් කටයුතු කිරීමේදි ඒවා සැලසුම් කිරීම, සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජාතික සභාව යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවා ඇත. එහි ප්‍රධාන කාර්යය වනුයේ: (අ) ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම පිළියෙල කිරීමෙහිලා සභාවට සහාය වීම සහ අවශ්‍ය වූ විටෙක එය උසස් තත්ත්වයට පත් කිරීම පිණිස යෝජනා ඉදිරිපත් කිරීම සඳහා සභාවට සහාය වීම (ආ) ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැසුම් ක්‍රියාත්මක කිරීම සඳහා වගකිම් භාරගැනිම සහ ව්‍යසන අවස්ථාවක් ප්‍රකාශයට පත් කිරීමේදි ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම (ඇ) අමාත්‍යාංශ, රජයේ දේපාර්තමේන්තු හෝ රාජ්‍ය සංස්ථා විසින් පිළියෙල කරනු ලබන විවිධ ව්‍යසන කළමනාකරණ සැලැසුම් ජාතික ව්‍යසන කළමනාකරණ සැලසුම් වලට අනුකූල වන බවට වගබලා ගැනිම (ඈ) 10 වන වගන්තිය යටතේ විවිධ අමාත්‍යාංශ, ආණ්ඩුවේ දේපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථා විසින් පිළියෙල කරන ලද ව්‍යසන කළමනාකරණ සැලැසුම් මත පදනම්ව ව්‍යසනවලට සූදානම් වීම, ව්‍යසන අඩුකිරීම, වැළැක්වීම, සහන සැලසීම, පුනරුත්ථාපනය කිරීම සහ ප්‍රතිසංස්කරණ කටයුතු කිරීම යන කරුණු සඳහා වැඩසටහන් සහ සැලසුම් පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීම හා එවැනි වැඩසටහන් සහ සැලසුම් ක්‍රියාත්මක කරන සංවිධාන සමග සම්බන්ධීකරණය කිරීම සහ එවැනි කටයුතු සඳහා මහා භාණ්ඩාගාරයෙන් මූල්‍ය සහාය ලබාගැනිම සහ එම මුදල් අදාළ ප්‍රදේශවලට මුදා හැරීම සහ එම කටයුතු නිගමනය කිරීම සහ ඇගැයීම (ඉ) ව්‍යසන කළමනාකරණයට අදාළ කටයුතු පිළිබඳව උචිත සංවිධානවලට, රාජ්‍ය නොවන සංවිධානවලට, දිසා ලේකම් කාර්යාලවලට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට උපදෙස් සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ එවැනි සංවිධාන සහ ලේකම් කාර්යාල සමග සම්බන්ධීකරණය වෙමින් වැඩ සටහන් ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම (ඊ) ව්‍යසන කළමනාකරණයට අදාළව පර්යේෂණ සහ සංවර්ධන වැඩ සටහන් ප්‍රවර්ධනය කිරීම සහ ව්‍යසන කළමනාකරණය පිළිබඳ දත්ත සමුදායක් පිහිටුවා පවත්වාගෙන යාම: සහ (උ) මධ්‍යස්ථානයේ කටයුතු පිළිබඳ වාර්තා වරින්වර සහ සභාවට අවශ්‍ය වන අවස්ථාවලදි පිළියෙල කොට සභාව වෙත ඉදිරිපත් කිරීම.

මෙම පනත අනුව ආපදා සම්බන්ධයෙන් සහන සැලැසීමේ ප්‍රතිපත්තිය වෙනුවට ඒ සඳහා කල් ඇතිව මුහුණ දීමට හැකිවන පරිදි අවශ්‍ය ප්‍රතිපාදන සළසා ඇත.

පනතේ විධිවිධාන අනුව මතු සඳහන් උපද්‍රව ආපදා කළමණාකරණය යටතට ඇතුලත්වේ.

- (අ) නායයාමක්
- (ආ) සුළි සුළගක්
- (ඇ) ගංවතුරක්
- (ඈ) නියඟයක්
- (ඉ) කාර්මික උපද්‍රවයක්
- (ඊ) සුනාමියක් (භූමිකම්පනාසන්න චලනයක්)
- (උ) භූමිකම්පාවක්
- (ඌ) ගුවන් උපද්‍රවයක්
- (එ) සමුද්‍රිය උපද්‍රවයක්
- (ඒ) ගින්නක්
- (ඔ) වසංගතයක්
- (ඕ) පිපිරීමක්
- (ක) ගුවන් ප්‍රහාරයක්
- (ග) සිවිල් හෝ අභ්‍යන්තර ගැටුමක්
- (ච) රසායනික අනතුරක්
- (ජ) විකිරණශිලිත්වයෙන් හටගත් හදිසි අවස්ථාවක්
- (ට) ගොඩබිම සහ මුහුදේ සිදුවන තෙල් පීටාර ගැලිම් ඇතුළුව තෙල් පිටාර ගිලිමක්
- (ඩ) න්‍යෂ්ටික ආපදාවක්
- (ණ) නාගරික සහ වනාන්තර ගිනි ගැනිමක්
- (ත) වෙරළ ඛාදනය විමක් සහ
- (ද) ටොනාඩෝ චණ්ඩ මාරුතයක්, අකුණු සැර වැදිමක් සහ දරුණු ගිගිරුම් සහිත කුණාටුවක්.

වර්ෂ 2005 ජුලි මාසයේදි අතිගරු ජනාධිපති තුමියගේ ප්‍රධානත්වයෙන්වූ ජාතික සභාව යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවන ලදි.

වර්ෂ 2005 ඔක්තෝම්බර් මස 12 වන දින ජාතික සභාවේ සමාරම්භක රැස්විමේදි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවිම, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සංවිධානත්මක සටහන, අධ්‍යක්‍ෂ ජනරාල් වරයා පත් කිරිම, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලය, වැටුප් දීමනා, 2005 වර්ෂයේ අයවැය, 2006 වර්ෂයේ අයවැය, ආපදා කළමනාකරණ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්, 2006 වර්ෂයේ ක්‍රියාකාරි වැඩ සටහන් හා කාර්යය මණ්ඩලය බඳවා ගැනිම යන කරුණු සඳහා අනුමැතිය ලබා දෙන ලදි.

වර්ෂ 2005 දෙසැම්බර් මාසයේදි ආපදා කළමනාකරණය පිළිබඳ වෙනම අමාත්‍යාංශයක් ගරු අග්‍රාමාත්‍ය තුමා යටතේ පිහිටුවන ලදි. වර්ෂ 2006 පෙබරවාරි මාසයේ එම අමාත්‍යාංශය යටතේ මානව හිමිකම්

විෂයද ඇතුලත් කොට ආපදා කළමනාකරණ හා මානව හිමිකම් පිළිබඳ අමාත්‍යාංශය පිහිටුවන ලදි. ඒ සම්බන්ධයෙන් නිකුත් කරණ ලද අති විශේෂ ගැසට් නිවේදනය අනුව ජාතික සභාව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා කාලගුණවිද්‍යා දේපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශය යටතට ඇතුලත්වේ. ගැසට් නිවේදනය අනුව ආපදා කළමණාකරණ මධ්‍යස්ථානයට මතු සඳහන් ආපදා කළමනාකරණ කටයුතු පැවරේ.

1. ව්‍යසන ලිහිල් කිරීම, වැළැක්වීමේ ප්‍රතිචාර සහ යථාතත්වීකරණය සඳහා විදේශ ආධාර සහිත ව්‍යාපෘතීන් ඇරඹීම සහ සම්බන්ධීකරණය කිරීම.

2. එම වගකීම කාලීනව ක්‍රියාවේ යෙදවීම සහතික කර ගැනීම පිණිස අමාත්‍යාංශ, රජයේ බලධාරීන් සහ නියෝජිතායතන, පෞද්ගලික අංශයීය නියෝජිතායතන, රජය නොවන සංවිධාන හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ අදාල සෙසු සියළුම නියොජිතායතන සමග සබඳතා ඇති කර ගැනීම.

3. ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදු කරනු ලබන්නාවූ ව්‍යසනයන්ට අදාළව සහන සැලසීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ කළමනාකරණය කිරීම.

4. ස්වාභාවික ව්‍යසන සහ මිනිසා විසින් සිදු කරනු ලබන්නාවූ ව්‍යසන පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

5. පෙර අනතුරු හැඟවුම් පද්ධතීන්.

6. ව්‍යසන කළමනාකරණය, සහන සැලසීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනයට අදාළව රාජ්‍ය නොවන සංවිධාන සහ සමාජ සුබසාධන ස්වේච්ඡා නියෝජිතායතනයන්හි කටයුතු අධීක්ෂණය කිරීම.

7. ව්‍යසන කළමනාකරණ හා මානව හිමිකම් ක්ෂේත්‍රයන්හි ලා රාජ්‍ය නොවන සංවිධාන සහ සමාජ සුබසාධන ස්වේච්චා නියෝජිතායතනයන්හි කටයුතු පහසුකර ලීම සහ ඒවාට ආධාර සැලසීම.

ආරම්භයේ අතිගරු ජනාධිපතිනියගේ උපදෙස් පරිදි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවීමත් සමග සුනාමියෙන් පීඩාවට පත් දිස්ත්‍රික්ක 09 සඳහා ආපදා කළමණාකරණ ඒකක පිහිටුවන ලදි. ඒ සඳහා ආරක්ෂක අංශ මගින් හා පොලිස් විශේෂ කාර්යය බලකායෙන් නිදහස් කරනු ලැබූ නිළධාරීන් දිස්ත්‍රික්ක සම්බන්ධීකාරකවරුන් වශයෙන්ද තවත් 20 පමණ සෙසු නිළධාරීන් සහකාර සම්බන්ධාකාර නිළධාරීන් වශයෙන් පත්කරන ලද අතර ඔවුන් දිස්ත්‍රික් ලේකම් වරයාගේ අධීක්ෂණය යටතේ කටයුතු කරනු ලබයි. දිස්ත්‍රික්ක ඒකක සඳහා එම නිළධාරීන් අනුයුක්ත කිරීමට පෙර ඔවුන් සඳහා කෙටි කාලීන පුහුණුවක්ද ලබාදෙන ලදි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරී අංශයන් වන ආපදා අවම කිරීම් හා තාක්ෂණ, පුහුණු කිරීම් හා දැනුවත් කිරීම්, පෙර සැළසුම්, හදිසි මෙහෙයුම්, මුදල් හා පරිපාලන අංශ සඳහා කාර්යය මණ්ඩල

බඳවා ගැනිම සඳහා පියවර ගන්නා ලදි. ක්‍රමයෙන් මේවනවිට දිස්ත්‍රික් 22 සඳහා සීමිත පහසුකම් යටතේ දිස්ත්‍රික්ක ආපදා කළමානාකරණ ඒකක පිහිටුවිමට පියවර ගෙන ඇත.

දැක්ම:

ශ්‍රී ලංකාවේ සුරක්‍ෂිත ප්‍රජා සහ තිරසාර සංවර්ධනය.

අරමුණ:

ස්වභාවික තාක්‍ෂණික සහ මිනිසා විසින් ඇති කරනු ලබන ව්‍යසන ක්‍රමානුකූල වු කළමනාකරණයක් මගින් ශ්‍රී ලංකාවේ සුරක්‍ෂිත භාවය තහවුරු කිරිම.

<u>2 වන කොටස</u>

## 2.1 <u>ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිළධාරින් පිළිබඳ ලුහුඩු විස්තරයක්</u>

| | |
|---|---|
| අධ්‍යක්‍ෂ ජනරාල් | මේජර් ජෙනරාල් ගාමිණි හෙට්ටිආරච්චි<br>ශාස්ත්‍රපති (ඉංග්‍රිසි හා පරිපාලන) (සබරගමුව)<br>මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාව (NIBM) |

2.2 **<u>ව්‍යසන කළමනාකරණ සඳහා වූ ජාතික සභාවේ සංයුතිය</u>**

| | |
|---|---|
| සභාපති | අතිගරු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය |
| උප සභාපති | අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා |
| විපක්ෂ නායක | ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා |

**පහත සඳහන් විෂයභාර අමාත්‍යවරුන්**

| | |
|---|---|
| සමාජ සුභසාධන | ගරු අමාත්‍ය සුමේධා ජී ජයසේන මැතිණිය |
| පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ | |
| පරිසරය | ගරු අමාත්‍ය ඒ එච් එම් ෆවුසි මැතිතුමා |

| | |
|---|---|
| ස්වදේශ කටයුතු | ගරු අමාත්‍ය අමරසිරි දොඩම්ගොඩ මැතිතුමා |
| සෞඛ්‍ය | ගරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා |
| විද්‍යා හා තාක්ෂණ | ගරු අමාත්‍ය මහාචාර්ය තිස්ස විතාරණ මැතිතුමා |
| නිවාස | ගරු අමාත්‍ය ෆේරියල් අෂ්රොෆ් මැතිතුමිය |
| වෙරළ සංරක්‍ෂණ | |
| වාරිමාර්ග | ගරු අමාත්‍ය ෆේරියල් අෂ්රොෆ් මැතිතුමිය |
| විදුලිබලය | ගරු අමාත්‍ය සුසිල් ප්‍රේම්ජයන්ත මැතිතුමා |
| ආරක්‍ෂක කටයුතු | ගරු අමාත්‍ය රත්නසිරි වික්‍රමනායක මැතිතුමා |
| පොලිසිය | ගරු අමාත්‍ය රත්නසිරි වික්‍රමනායක මැතිතුමා |
| මුදල් | ගරු අමාත්‍ය සරත් අමුණුගම මැතිතුමා |
| ඉඩම් | ගරු අමාත්‍ය තිස්ස කරලියද්ද මැතිතුමා |
| ධීවර සහ ජලජ සම්පත් | ගරු අමාත්‍ය මිල්රොයි ප්‍රනාන්දු මැතිතුමා |
| විදේශ කටයුතු | ගරු අමාත්‍ය අනුර බණ්ඩාරනායක මැතිතුමා |
| ජල සම්පාදන | ගරු අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා |
| මහාමාර්ග | ගරු අමාත්‍ය මහින්ද රාජපක්‍ෂ මැතිතුමා |
| නාගරික සංවර්ධන | ගරු අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා |
| අධ්‍යාපන | ගරු අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා |

## 3 වන කොටස

## 3. කාර්යාලය පිළිබඳ අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් කරනු ලබන සමාලෝචනය

වර්ෂ 2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත වර්ෂ 2005 ජූලි මස 13 දින සිට ක්‍රියාත්මක කරන ලදි.

2005 අංක 13 දරණ ව්‍යසන කළමනාකරණ පනත අනුව පිහිටුවනු ලැබූ ව්‍යසන කළමනාකරණ සඳහා වූ ජාතික සභාව සංස්ථාවක් වියයුතු අතර, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් එයට තිබිය යුතුය.

## ජාතික සභාවේ සංයුතිය




2005 අංක 13 ව්‍යසන කළමනාකරණ පනතේ 8(1) වගන්තිය අනුව පිහිටුවන ලද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 2005 අගෝස්තු 1 දින සිට කටයුතු අරඹන ලදී.

## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සංයුතිය




## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සංවිධානය කිරීම

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කිරීමත් සමගම එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) අනුග්‍රහය ඇතිව එහි කාර්‍යය මණ්ඩලය පත්කිරීමේදී අවශ්‍ය තෝරාගැනීමේ පටිපාටි, වැටුප් ක්‍රම හා සංවිධාන ව්‍යුහය සකස් කරන ලදී.

එසේ සකස් කරන ලද සංවිධාන ව්‍යුහය සේවක සංඛ්‍යා ජාතික සභාවේ අනුමැතිය අපේක්ෂාවෙන් කැබිනට් මණ්ඩලය විසින් 2005 සැප්තැම්බර් 14 දින අනුමතකරන්ට යෙදුනි.

පරිපාලනය පිළිබඳ ජාතික සභාවේ අනුමැතිය අපේක්ෂාවෙන් යෝජිත වැටුප් ක්‍රමය ජාතික සභාව විසින් අනුමත කරන ලදී. එයට සංවිධාන ව්‍යුහය හා සේවක සංඛ්‍යාද ඇතුලත් වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවක සංඛ්‍යා අවශ්‍යතා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද අතර යෝජිත වැටුප් ක්‍රම පරිපාලනය පිළිබඳ ජාතික සභාව විසින් සංශෝධන සහිතව අනුමත කරන ලදී.

**දිස්ත්‍රික්ක ආපදා කළමනාකරණ ඒකක පිහිටුවීම**

වර්ෂ 2005 වර්ෂයේ සැප්තැම්බර් මස දී දිසාපති/ දිස්ත්‍රික්ක ලේකම් වරුන්ගේ අධීක්ෂණය යටතේ දිස්ත්‍රික්ක ආපදා කළමනාකරණ ඒකක 9 ක් කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, පුත්තලම, ත්‍රිකුණාමලය, සහ අම්පාර දිස්ත්‍රික්කයන්හි පිහිටුවන ලදී. මේ සඳහා යුද, නාවික, ගුවන් සහ පොලිස් විශේෂකාර්යය බලකායේ නිළධාරීන් මුදාහැර ඇත. මෙම ඒකක සඳහා හමුදා නිලධාරීන් 222 ක් මුදාහැර ඇති අතර ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ නිළධාරි වශයෙන්ද කනිෂ්ඨ නිලධාරීන් 15 ක් ඔවුන්ගේ සහාය සඳහා පත්කර ඇත. සෙසු දිස්ත්‍රික්ක 16 සඳහා එම ඒකක පිහිටුවීමට පියවර ගෙන ඇති අතර කාර්ය මණ්ඩලයද පත්කිරීමට පියවර ගෙන ඇත.

### දිස්ත්‍රික්ක ආපදා කළමනාකරණ ඒකකයන්හි ව්‍යුහය




ඒ අතරතුර දැනට මධ්‍යස්ථානයේ ක්‍රියාකිරීම් ගැන පසු විපරමක යෙදීමේ ප්‍රතිඵලයක් වශයෙන් මේවනවිට මුහුණපා ඇති යම් යම් ඌනතා මෙන් අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීම සහ සේවක සංඛ්‍යා සංශෝධනයක අවශ්‍යතාවයද පැන නැගී ඇත. ඒ අනුව සේවක සංඛ්‍යා සංශෝධන පිළිබඳ යෝජනා ජාතික සභාවට මෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව 2007 සපුරාලීමට අපේක්ෂිතය.

ආරම්භයේ සිට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වසරක් තුළ ස්ථාන තුනක් කරා ගෙන යාමට සිදුවිය. ඒ අනුව දැනට කාලගුණ දෙපාර්තමේන්තු පරිශ්‍රයේ භූමි භාගයක මහල් කිහිපයකින් යුත් ගොඩනැගිලි සංකීර්ණයක් ගොඩනැගීමට පියවර ගෙන ඇත.

## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ඉටුකරණ ලද කාර්යයන් හා දැනට ඉටුකිරීමට ඇති කටයුතු වල ප්‍රගතිය

- රාජ්‍ය නිලධාරීන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් අන්තර්ජාතික හා රාජ්‍ය නොවන සංවිධාන නිලධාරීන් වෙනුවෙන් වැඩමුළු 8ක් කොළඹ, ගම්පහ, පුත්තලම, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයන්හි පවත්වන ලදී.

❖ සුරක්ෂිත ශ්‍රී ලංකාවක් සඳහාවූ ආපදා කළමනාකරණය උදෙසා 2005 සිට 2015 වෙනුවෙන් දස අවුරුදු සැලැස්මක් සම්පාදනය කරන ලදී. Roadmap for a safer Sri Lanka මෙහි කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගුකාලීන ව්‍යාපෘති 100ක් පමණ අඩංගු වේ.

## ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හවුල්කාර පාර්ශවයන්




## ප්‍රාදේශීය මට්ටමේ ක්‍රියාකාරකම්

පුත්තලම, ගම්පහ, කොළඹ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, අම්පාර සහ රත්නපුර යන දිස්ත්‍රික්කයන්හි මත සඳහන් කාර්යයන් ඉටු කරන ලදී.

- ♣ දිස්ත්‍රික්ක ආපදා කළමනාකරණ කමිටු පිහිටුවීම
- ♣ ප්‍රාදේශීය මට්ටමේ ආපදා කළමනාකරණ කමිටු පිහිටුවීම.

# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

## 2005.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම

## 2005.12.31 දිනට ශේෂ පත්‍රය

**ස්ථාවර වත්කම්**

| | | රු.ශ | රු.ශ |
|---|---|---|---|
| කාර්යාල උපකරණ | ඇමුණුම 1 | 5,998,880.24 | |
| ලිබඩු හා සවිකිරීම් | ඇමුණුම 2 | 478,804.70 | |
| | | | 6,477,684.94 |
| ආදායමට වැඩි වියදම | | | |
| | | | 1,716,744.00 |
| එකතුව | | | 8,194,428.94 |
| **ප්‍රාග්ධනය** | | | |
| භාණ්ඩාගාර ප්‍රාග්ධන ආධාර | | 645,404.70 | |
| පරිත්‍යාග | ඇමුණුම 3 | 5,832,280.24 | |
| | | | 6,477,684.94 |
| ජංගම වගකීම් | | | |
| උපචිත වියදම් | ඇමුණුම 4 | | 1,716,744.00 |
| එකතුව | | | 8,194,428.94 |

**අධ්‍යක්ෂ ජනරාල්** **නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්)**
**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය.**

## 2005.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම

## 2005.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම

| **ආදායම්** | **රු.ශ** | **රු.ශ** |
|---|---|---|
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ආධාර | | 4,342,517.53 |
| **වියදම්** | | |
| පුද්ගල පඩිනඩි | | |
| දිමනා | 4,223,520.00 | |
| සැපයුම් | 68,587.50 | |
| ගිවිසුම් ගත සේවා | 1,657,060.53 | |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 110,093.50 | |
| **පුනරාවර්තන වියදම් - එකතුව** | | 6,059,261.53 |
| **ආදායමට වැඩි වියදම** | | (1716744.00) |

# <u>ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය</u>

# 2005 ගිණුම්

## <u>2005.12.31 දිනට අවසන් වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය</u>

| ලැබීම් | රු.ශ | යෙදවීම් | රු.ශ | |
|---|---|---|---|---|
| භාණ්ඩාගාර අරමුදල් | 5,000,000.00 | <u>මෙහෙයුම් කායයී</u> | | |
| ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලැබීම් | 12,077.77 | දීමනා | 2,915,840.00 | |
| | | සැපයුම | 68,587.50 | |
| | | ගිණුම්ගත සේවා | 1,247,996.53 | |
| | | වෙනත් පුනරාවර්තන වියදම් | 110,093.50 | 4,342,517.53 |
| | | **ආයොජන කායයී** | | |
| | | කාර්යාල උපකරණ | 166,600.00 | |
| | | ලිබඩු හා සවිකිරීම් | 478,804.70 | |
| | | | | 645,404.70 |
| | 4,987,922.23 | | | 4,987,922.23 |

# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

## 2005.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම

### 2005.12.31 දිනට ශේෂ පිරික්සුම

| විස්තරය | ලෙජර පිටුව | රු.ශ | හර රු.ශ | බැර රු.ශ |
|---|---|---|---|---|
| **පුනරාවර්තන ආධාර** | 44 | | | 4,342,517.53 |
| **ප්‍රාග්ධන ආධාර** | 35 | | | 645,404.70 |
| උපචිත වියදම් | 27 | | | 1,716,744.00 |
| කාර්යාල උපකරණ | 38 | | 5,998,880.24 | |
| **ගිවිසුම් ගත සේවා** | | | | |
| විදුලිසංදේශ වියදම් | 10 | 79,815.53 | | |
| තැපැල්ගාස්තු | 16 | 770.00 | | |
| කුලී ගෙවීම් | 14 | 890,725.00 | | |
| මුද්‍රණ හා ප්‍රචාරන | 12 | 685,750.00 | | |
| | | | 1,657,060.53 | |
| **සැපයුම්** | | | | |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | 06 | 66,613.50 | | |
| වෙනත් සැපයුම් | 08 | 1,974.00 | | |
| | | | 68,587.50 | |
| **වෙනත් පුනරාවර්තන සේවා** | | | | |
| විශේෂ සේවා | 18 | 86,000.00 | | |
| අනෙකුත් දීමනා | 20 | 850.00 | | |
| සංග්‍රහ වියදම් | 22 | 23,243.50 | | |
| | | | 110,093.50 | |
| **පුද්ගල පඩිනඩි** | | | | |
| දීමනා | | | | |
| ප්‍රධාන කාර්යාලය | 02 | 350,000.00 | | |
| දිස්ත්‍රික් සම්බන්ධකරණ නිළධාරින් | 04 | 3,873,520.00 | | |
| | | | 4,223,520.00 | |
| ආධාර | 41 | | | 5,832,280.24 |
| කාර්යාල ලිබඩු | 36 | | 478,804.70 | |
| **එකතුව** | | | 12,536,946.47 | 12,536,946.47 |

| | | | |
|---|---|---|---|
| පරිත්‍යාග | 11 | | |
| වැයවූ මූලධන ආධාර | 13 | | |
| වැය නොවූ මූලධන ආධාර | 15 | | |
| පොදු සංචිත | 17 | 1,716,744.00 | |
| සුළුමුදල් අත්තිකාරම් | 21 | 23,816.60 | |
| පුද්ගල පඩිනඩි | 23 | 23,449,698.41 | |
| ගමන් වියදම් | 31 | 167,795.98 | |
| | 25 | 1,100,422.64 | |
| | 27 | 51,867.50 | |
| වාහන කුලි ගාස්තු | 35 | 6,973,020.75 | |
| ගොඩනැගිලි කුලි | 37 | 6,176,305.00 | |
| | 39 | 499,464.06 | |
| විදුලිය | 41 | 499,433.91 | |
| මිශ්‍ර අත්තිකාරම් | 43 | 70,000.00 | |
| සැපයීම් | 49 | 584,924.17 | |
| වෙනත් ජංගම වියදම් | 53 | 638,376.39 | |
| නඩත්තු වියදම් | 55 | 12,575.00 | |
| කෙරීගෙනයන වැඩ | | | |
| පස් පරීක්ෂණ | 59 | 1,257,866.00 | |
| ජල ටැංකි | 61 | 1,768,853.00 | |
| ටෙන්ඩර් ගාස්තු | 45 | | 213,250.00 |
| රජයේ ආධාර | 47 | | 39,142,550.00 |
| තොග | 51 | 463,957.08 | |
| ස්වාභාවික බාදක සඳහා ආධාර | 67 | | 342,000.00 |
| මිශ්‍ර ආදායම් | 69 | | 69,550.00 |
| 2006.12.31 මුදල් ශේෂය | | 1,435,541.53 | |
| ජාතික ආරක්ෂක දිනය සඳහා අර | 57 | | 2,529,438.00 |
| ජාතික ආරක්ෂක දිනය සඳහා වැ | 58 | 2529438 | |
| | | **74,493,992.96** | **67,370,680.94** |

5

# <u>ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය</u>

## <u>2005 ගිණුම්</u>

### <u>2005.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම</u>

### <u>2005.12.31ට කාර්යාල උපකරණ වටිනාකම</u>

ඇමුණුම 1

| වර්ගය | ප්‍රමාණය | ඒකක මිල රු.ශ | | වටිනාකම රු.ශ |
|---|---|---|---|---|
| **පරිගණක හා උපාංග** | | | | |
| ප්‍රොජෙක්ටර් | 2 | 103,160.00 | 206,320.20 | |
| එච්පී ලේසර් ජෙට් ප්‍රින්ටර් | 24 | 243,154.00 | 486,308.50 | |
| යුපිඑස් | 32 | 3,584.00 | 114,685.21 | |
| එච්පී නොට් බුක් | 08 | 168,463.00 | 1,347,704.35 | |
| අයි බී එම් ඒ51 කොම්පියුටර් | 32 | 108,118.00 | 3,459,761.98 | |
| | | | | 5,614,780.24 |
| ෆැක්ස් යන්ත්‍ර | 15 | | | 217,500.00 |
| | | | | 5,832,280.24 |
| සේප්පු | 01 | | 19,750.00 | |
| කොම්පියුටර මොඩම් | 01 | | 2,850.00 | |
| දුරකතන | | | | 22,600.00 |
| - සන්ටෙල් | 10 | 7,500.00 | 75,000.00 | |
| - ටෙලිකොම් දුරකතන | 03 | 23,000.00 | 69,000.00 | |
| | | | | 144,000.00 |
| මුලු එකතුව | | | | 5,998,880.24 |

☆ යුඑන්ඩීපී පරිත්‍යාග

# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

# 2005 ගිණුම්

## 2005.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම

## 2005.12.31.ට ලිබඩු හා සවිකිරිම්

| විස්තරය | ප්‍රමාණය | ඒකක මිල | ඇමුණුම 2<br>වටිනාකම |
|---|---|---|---|
| | | රු | රු |
| ලියන මේස | 04 | 20,366.50 | 81,466.00 |
| උස පුටු | 04 | 7,560.00 | 34,776.00 |
| ලියන මේස | 03 | 16,364.50 | 49,093.50 |
| පරිගනක මේස | 02 | 7,618.75 | 15,237.50 |
| ලියන මේස | 04 | 15,162.75 | 60,651.00 |
| පරිගණක පුටු | 02 | 3,553.00 | 7,107.00 |
| වානේ කැබිනට් | 02 | 9,527.00 | 19,055.50 |
| ලිපිගොනු කැබිනට් | 01 | 9,625.00 | 9,625.50 |
| | | | 277,012.00 |
| බහු කාර්ය රඳවන | 01 | 345.70 | 345.70 |
| කෝපි මේස ( වීදුරු මතුපිට) | 01 | 6,588.00 | 6,588.00 |
| ප්‍රින්ස් සොෆා සෙට් | 01 | 48,069.00 | 48,069.00 |
| හාන්සි පුටු | 08 | 3,125.00 | 22,500.00 |
| විධායක පුටු | 07 | 7,500.00 | 47,250.00 |
| විධායක පුටු (ක ) | 03 | 5,145.00 | 13,891.50 |
| එල්පි කණිෂ්ඨ විධායක පුටු | 03 | 8,865.00 | 23,935.50 |
| මුවබල් කැබිනට් | 03 | 6,190.00 | 16,713.00 |
| හාන්සි පුටු (රෙදි) | 08 | 3,125.00 | 22,500.00 |
| | | | 201,792.70 |
| | | | 478,804.70 |

| | | | |
|---|---|---|---|
| මේස ( L.P.Ex:Table 52x76 cm cur.top with p.Draw.) | 05 | 50,287.50 | 251,437.50 |
| | | | - |
| මේස :L.P.Ex.Table 183x91cm cur.top with p.draw) | 01 | 11,335.50 | 11,335.50 |
| | | | - |
| මේස (L.P.site Table 12x61 cm) | 01 | 6,030.00 | 6,030.00 |
| | | | - |
| | | **246,383.20** | - |
| | | | - |
| | | | - |
| | | | - |
| | | | - |
| | | | - |
| | | | - |
| | | | - |
| හාන්සි පුටු | | | - |
| | | | - |
| | 2 | 14,166.00 | 28,332.00 |
| | | **328,202.20** | |
| | | | **1,436,414.10** |

# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
# 2005 ගිණුම්

## 2005.12.31 දිනට පරිත්‍යාග

| | | | | ඇමුණුම 3 |
|---|---|---|---|---|
| ආධාර දුන් ආයතනය | ප්‍රමාණය | විස්තරය | ඒකක මිල | වටිනාකම |
| යූ එන් ඩී පී | 08 | එච්පි නොට්බුක් පරිගණක | 168,463.04 | 1,347,704.35 |
| | 02 | එච්පි ප්‍රොජෙක්ටර් | 103,160.10 | 206,320.20 |
| | 32 | යූපීඑස් | 3,583.91 | 114,685.21 |
| | 32 | අයිබීඑම් ඒ51 පරිගණක | 108,117.56 | 3,459,761.98 |
| | 24 | එච්පි ලේසර් ජෙට් ප්‍රින්ටර් | 20,262.85 | 486,308.50 |
| | 15 | ජායා පිටපත් යන්ත්‍ර | 14,500.00 | 217,500.00 |
| | | | | 5,832,280.24 |

# ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

## 2005 ගිණුම්

## 2005.12.31. දිනට උපචිත වියදම්

ඇමුනුම 4

| 2005 දෙසැම්බර් මස වාහන කුලි ගාස්තු | වවුචර් අංකය | මුදල |
|---|---|---|
| | 29 | 48,000.00 |
| | 32 | 55,000.00 |
| | 34 | 35,484.00 |
| | 37 | 55,000.00 |
| | 38 | 17,742.00 |
| | 41 | 48,000.00 |
| | 42 | 45,000.00 |
| | 43 | 7,258.00 |
| | 45 | 30,161.00 |
| | 49 | 40,806.00 |
| | 50 | 26,613.00 |
| | | 409,064.00 |
| දිස්ත්‍රික් ආපදා සම්බන්ධිකරණ නිලධාරීන්ට දීමනා | | 1,307,680.00 |
| | | **1,716,744.00** |

# ආපදා කලමනාකරණ මධ්‍යස්ථානය
# ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ සටහන

**2005 දෙසැම්බර් 31**

## 01. මූලික ගිණුම් ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් ස්ථාපිත කොට ඇති ගිණුම් ප්‍රමිතින්ට හා පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත. වත්කම් සතු කරගනුලබන හා වගකීම් ඇති කරගනු ලබන දිනට පවත්නා වටිනාකම මත ගණු දෙනු වාර්තා කර තිබේ.

## 02. ලැබීම්

සියලු අරමුදල් භාණ්ඩාගාරය වෙතින් ලැබීඇත.
ප්‍රග්ධන හා පුනාරාවර්තන ස්වභාවයේ වියදම් හැඳින ගෙන ඒ අනුව ගිණුම් පොත්වල වාර්තා කර තිබේ.

## 03. වත්කම් හා එහි වටිනාකම

සියලු වත්කම් ගත්මිලට දක්වා ඇත.

## 04. පරිත්‍යග

එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන විසින් පරිත්‍යාග කරන ලද කාර්යාල උපකරණ ගත්මිලට වාර්ථා කර ඇත.

## 05. ක්ෂය කිරීම

මිලට ගත් වර්ෂය තුල ක්ෂය කිරීම් කරනු නොලැබේ.

මගේ අංකය-එන්ඩී/ඒ/ඩීඑම්සී/එෆ්ඒ/2005 2006 ඔක්තෝබර් 05 දින

ලේකම්,
ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යංශය

ආපදා (ව්‍යසන) කළමනාකරණ මධ්‍යස්ථානයේ 2005 ජූලි 12 සිට 2005 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ආපදා (ව්‍යසන) කළමනාකරණ මධ්‍යස්ථානයේ 2005 ජූලි 12 දින සිට 2005 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 18 වෙනි වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමග සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළයුතු යැයි මා අදහස් කරන මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාව මෙයට අතිරේකව නිකුත් කරනු ලැබේ.

1.2 විගණන විෂය පථය

---

මෙම වාර්තාවේ ඇතුලත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, විධි සහ පරිචයන්ට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන සාක්ෂි පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු හා නිගමන තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම හා යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සුදුසුද, ඒවා ඒකාකාරිව අනුගමනය කරන ලද්දේද හා ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කරන ලද්දේදැයි නිගමනය කිරීම විගණනයට ඇතුළත් විය. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

1.3 ආපදා (ව්‍යසන) කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවීම

.........................................................................................................................

(අ) 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 1 වගන්තිය ප්‍රකාරව අදාල අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පල කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනක සිට ක්‍රියාත්මක වේ. 2005 සැප්තැම්බර් 29 දින හා අංක 1412/31 දරන ගැසට් නිවේදන අනුව මෙම පනත 2005 ජුලි 01 දින සිට ක්‍රියාත්මක විය.

(ආ) යථෝක්ත පනතේ 2(1) වගන්තිය අනුව "ව්‍යසන කළමනාකරණය සඳහා වු ජාතික සභාව" යනුවෙන් මණ්ඩලයක් සංස්ථාපනය කර තිබුණි. එම ජාතික සභාව ජනාධිපතිවරයා (සභාපති), අග්‍රාමාත්‍යවරයා, විපක්ෂ නායක වරයා, අමාත්‍යවරුන් 20 දෙනෙකු හා පළාත් සභා ප්‍රධාන අමාත්‍යවරුන්ගෙන් හා නම් කරනු ලබන විපක්ෂ මන්ත්‍රි වරුන් 5 දෙනෙකුගෙන් සමන්විත වේ.

ජාතික සභාවේ ප්‍රථම රැස්වීම 2005 ඔක්තෝබර් 12 දින පවත්වා තිබුණි.

(ඇ) යථෝක්ත පනතේ 8(1) වගන්තිය අනුව "ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවා තිබුණි. " එහෙත් එහි නම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යනුවෙන් භාවිතා කර තිබුණි.

1.4 ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානයේ කර්තව්‍යයන්

.........................................................................................................

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 8(1) වගන්තිය ප්‍රකාරව ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවා තිබුණු අතර, එම මධ්‍යස්ථානයේ කර්තව්‍යයන් පහත දැක්වේ.

(අ) ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම පිළියෙල කිරීමට සහායවීම.

(ආ) ව්‍යසන කළමනාකරණ සැලැස්මට අනුව හදිසි අවස්ථා මෙහෙයුම් වගකීම භාරගෙන මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය.

(ඇ) අනිකුත් රාජ්‍ය ආයතනවල ව්‍යසන කළමනාකරණ සැලසුම් ප්‍රධාන සැලැස්මට අනුකූලවන බවට වග බලා ගැනීම.

(ඈ) අනිකුත් රාජ්‍ය ආයතන වලින් සිදුකෙරෙන ව්‍යසන කළමනාකරණය සැලසුම් වෙනුවෙන් මුල්‍ය සහාය ලබාදීම හා නියාමනය කිරීම.

(ඉ) ව්‍යසන කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් වූ අනිකුත් ආයතන හා සංවිධාන සමග සම්බන්ධීකරණය හා උපදෙස්දීම.

(ඊ) ව්‍යසන කළමනාකරණයට අදාලව පර්යේෂණ හා සංවර්ධන වැඩ සටහන් පිළිබඳ දත්ත රැස් කර ගැනීම හා පවත්වාගෙන යාම.

(උ) මධ්‍යස්ථානයේ කටයුතු පිළිබඳ වාර්තා වරින්වර සභාවට ඉදිරිපත් කිරීම.

1.5 විගණන ප්‍රතිපාදන

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 2 වගන්තිය අනුව - ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව යනුවෙන් මණ්ඩලයක් පිහිටුවා ඇත. 17 වගන්තිය අනුව - ජාතික සභාව සඳහා අරමුදලක් පිහිටුවිය යුතුය. 18 වගන්තිය අනුව - ජාතික සභාවේ අරමුදල පිළිබඳ ගිණුම් විගණනය පිළිබඳ ප්‍රතිපාදන සලසා ඇත.

2. මුල්‍ය ප්‍රකාශන

2.1 මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 8 වන වගන්තිය අනුව පිහිටුවනු ලැබූ මෙම මධ්‍යස්ථානයේ ආදායම් වියදම්ද, වත්කම් බැරකම්ද සහ වෙනත් සියළු ගනුදෙනු සම්බන්ධයෙන් ද ගිණුම් පොත් පවත්වා ගැනීමත් මුල්‍ය ප්‍රකාශන අත්සන් කර ඉදිරිපත් කිරීමත්, මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) විසින් කර තිබුණි. මේ පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) මෙම මධ්‍යස්ථානයේ මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ නෛතික භාවය පිළිබඳ විමසීමේදී, ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභා ප්‍රථම රැස්වීමේදී ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානයේ 2005, 2006 වර්ෂවල අයවැයද ආයතනික ව්‍යුහයද අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පත්වීමද 2006 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මද අනුමත කර ඇති බැවින්

එමගින් ආපදා (ව්‍යසන) කළමනාකරණ මධ්‍යස්ථානය ක්‍රියාත්මක වීම නිත්‍යානුකූල යැයි ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් මාවෙත වාර්තා කර තිබුණි.

(ආ) අතිගරු ජනාධිපතිතුමා විසින් 2006 පෙබරවාරි 20 දින හා අංක 1433/11 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයක් මගින් ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යවරයාට ව්‍යසන කළමනාකරණය සඳහා වු ජාතික සභාව හා ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය යන විෂයයන් හා කාර්යයන් පවරා දි තිබුණි.

(ඇ) ආපදා (ව්‍යසන) කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු වෙනුවෙන් රජයේ ප්‍රදානයන් සැලසිම යථෝක්ත අමාත්‍යාංශයේ වැය ශිර්ෂය යටතේ සිදුකර තිබුණි.

(ඈ) යථෝක්ත පනතේ 17 වගන්තිය අනුව ජාතික සභාව සඳහා අරමුදලක් පිහිටුවා නොතිබිම නිසා එම අරමුදල සඳහා මුල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් නොවිය.

(ඉ) ජාතික සභාවේ කටයුතු මෙහෙයවිම සඳහා ප්‍රධාන විධායක නිලධාරියකු පත්කර නොතිබුණි.

මේ අනුව ආපදා (ව්‍යසන) කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ලෙස අමාත්‍යාංශයේ ලේකම්වරයා දැනට කටයුතු කළයුතු බව පෙනේ.

## 2.2 මතය

මාගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට හා මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරිම් අනුව ආපදා (ව්‍යසන) කළමනාකරණ මධ්‍යස්ථානය 2005 ජුලි 12 දින සිට 2005 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ජේදය සඳහා නිසි ගිණුම් පොත් පත් පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මුල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2005 දෙසැම්බර් 31 දිනට ආපදා (ව්‍යසන) කළමනාකරණ මධ්‍යස්ථානයේ මුල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් ගිණුම් කාලපරිජේදය සඳහා එහි මෙහෙයුම් ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධරණ ලෙස දැක්වෙන අයුරින් උක්ත පොත්පත් වලට එකගව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට සහ දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට සහ මුල්‍ය ප්‍රකාශන සමඟ දී ඇති උපලේඛන(අංක 1 සිට 4 දක්වා) වලට අනුකුලව මුල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වු මතය වේ.

2.3 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම නිසා සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

| | ගිණුම් විෂයය | මුදල | නොසැපයු සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | මධ්‍යස්ථානයට අනුයුක්තව සේවය කරනු ලබන හමුදා නිලධාරීන් සඳහා ගෙවීම | 4,158,520 | i දීමනා ගෙවීම සඳහා පරිපාලනය සඳහා වන ජාතික සභාවේ අනුමැතිය<br>ii කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය.<br>iiii පත්වීම් ලිපි හා රාජකාරි ලැයිස්තු |
| (ආ) | කාර්යාල උපකරණ | 5,998,880 | සමික්ෂණ මණ්ඩල වාර්තා |
| | ලී බඩු සහ සවිකිරීම් | 478,805 | |

2.3.2 නිතී,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නිතී,රීති, යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|

| | |
|---|---|
| (අ) i භාණ්ඩාගාර චක්‍රලේඛ<br>1978 දෙසැම්බර් 19 දින හා අංක 842 දරන චක්‍රලේඛය | 2005 වර්ෂයේදී රු.6,477,685 කට මිලදී ගත් ස්ථාවර වත්කම් ලේඛනගත කර වත්කම් ලේඛනයක් නඩත්තු කළයුතු වුවත් එසේ කර නොතිබුණි. |
| ii 2002 නොවැම්බර් 28 දින හා අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛය | පරිගනක හා උපාංග සම්බන්ධයෙන් අංක වු වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| i මු.රෙ.395 (සී) | 2005 දෙසැම්බර් 31 දිනට වු බැංකු සැසඳුම් ප්‍රකාශයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| ii මු.රෙ.135 | ආයතනයේ පරිපාලන හා මුල්‍ය කටයුතු සම්බන්ධයෙන් බලතල පවරා නොතිබුණි. |
| iii මු.රෙ.756 හා 757 | 2005 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |

## 3. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මුල්‍ය ප්‍රතිඵල

2005 ජුලි 12 වන දින සිට දෙසැම්බර් 31 දින දක්වා වු කාලපරිච්ඡේදය සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.මිලියන 5 ක්වු ප්‍රතිපාදනයෙන් රු.4,342,517 ක් වැයකර තිබුණු අතර

උපචිත වියදම් ඇතුළුව සමස්ථ වියදම රු.6,059,261 ක් වුයෙන් රු.1,716,744 ක ඌනතාවයක් නිරික්ෂණය විය.

3.2 සභාවේ අරමුදල

ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව ආරම්භක ප්‍රාග්ධනය ලෙස රුපියල් මිලියන 10 ක් ඒකාබද්ධ අරමුදලින් ලබාගෙන අරමුදලක් පිහිටුවිය යුතු වුවත් එසේ කර නොතිබුණි.

3.3 මෙහෙයුම් කාර්ය සාධනය

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යසන කළමනාකරණය සඳහා වු ජාතික සභාව සමඟ සම්බන්ධිකරණයක් නොතිබීම.

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 8 වන වගන්තිය පරිදි පිහිටුවනු ලැබු ව්‍යවසන කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ව්‍යසන කළමනාකරණ සැලැස්මක් හා හදිසි අවස්ථා මෙහෙයුම් සලැස්මක් පිළියෙල කිරිමට ව්‍යාසන කළමනාකරණය සඳහා වු ජාතික සභාවට සහාය විය යුතු බවත්, ව්‍යසන කළමනාකරණය සැලැස්ම හා හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරිම හා සම්බන්ධීකරණය කිරිමත් මධ්‍යස්ථානයේ කාර්ය භාරයේ ප්‍රමුඛ අරමුණු වුවද ව්‍යසන කළමනාකරණ සභාව සමාලෝචිත ගිණුම් කාලපරිච්ජේදයේ ආරම්භයේ සිට අවසානය දක්වා රැස්වී ඇත්තේ එක් අවස්ථාවකදි පමණක් බවත් නිරික්ෂණය විය. ඒ අනුව මධ්‍යස්ථානයෙන් අපේක්ෂිත වු සම්බන්ධීකරණ කාර්යන් ඉටුවී ඇති බවක් නිරික්ෂණය නොවිය. ව්‍යසන කළමනාකරණය සඳහා වු ජාතික සභාවට ලේකම් වරයෙක්ද පත් කර නොතිබුණි.

(ආ) කාර්ය සාධනය

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 8(1) වගන්තිය යටතේ ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරි ඇති කර්තව්‍යයන් සමාලෝචිත කාලපරිච්ජේදය තුල ඉටු කර ඇති බැව් සනාථ කෙරෙන තොරතුරු වාර්තා වී නොතිබුණි.

(ඇ) කාර්ය මණ්ඩල බඳවා ගැනීම

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2005 ඔක්තෝබර් 06 දින හා අංක ඩීඑම්එස්/පීඑස්/16 දරන ලිපිය මගින් ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානයට 188 දෙනකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුනද 2005 දෙසැම්බර් 31 දින දක්වාම මධ්‍යස්ථානයේ සේවයට බඳවාගෙන තිබුණේ නිලධාරීන් 19 දෙනෙකු බවත් ඒ අයද කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද අය බවත් නිරීක්ෂණය විය.

(ඈ) මධ්‍යස්ථානයේ පරිපාලනය, මූල්‍ය කටයුතු හා අධීක්ෂණය

මධ්‍යස්ථානයේ පරිපාලනය මූල්‍ය කටයුතු හා අධීක්ෂණය ව්‍යසන කළමනාකරණ ජාතික සභාව සතු වුවද නියමිත පරිදි ජාතික සභාව රැස්වී හෝ ලේකම් වරයෙකු නම් කර හෝ පත් කර හෝ නොතිබූ බවත් නිරීක්ෂණය විය.

04. පද්ධති හා පාලන

පද්ධති හා පාලන සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු විගණන විමසුම් මගින් මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

(අ) මූල්‍ය
(ආ) වත්කම්
(ඇ) බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම
(ඈ) තොග
(ඉ) ලදුපත් නිකුත් කිරීම
(ඊ) වාහන උපයෝජනය

පී.ඒ. පේමතිලක
විගණකාධිපති